# නැගෙනහිර පළාත් සභාව- 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 මූල්‍ය පකාශන ඉදිරිපත් කිරීම

(අ) 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා වූ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 31 ට හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කළයුතු වුවද 2012 වර්ෂය සඳහා පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 03 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) **අනෙකුත් මූල්‍ය ප්‍රකාශන**

2013 මාර්තු 31 දිනට අනෙකුත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | | 2012 වර්ෂය | |
|---|---|---|---|---|
| | **ගිණුම්** | **මුළු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව** | **2013 මාර්තු 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව** | **2013 මාර්තු 31 දිනට ඉදිරිපත් නොකරන ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව** |
| (i) | විසර්ජන ගිණුම් | 33 | 21 | 12 |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 33 | 19 | 14 |
| (iii) | වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු | 09 | - | 09 |
| (iv) | අරමුදල් ගිණුම් | 02 | 02 | - |
| (v) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | 01 | - | 01 |
| (vi) | පෙර පාසැල් අධ්‍යාපන කාර්යාංශය | 01 | - | 01 |
| | | ----- | ----- | ----- |
| | | 79 | 42 | 37 |
| | | === | === | === |

**(ඇ) පළාත් සභාව සහ පළාත් පාලන ආයතන විසින් වාර්ෂික කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීම**

---

(i) 2004 පෙබරවාරි 24 දිනැති අංක 1/2004 දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව පළාත් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2004 පෙබරවාරි 24 දිනැති අංක 1/2004 දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව නැගෙනහිර පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන 45 ක වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කර පළාත් සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 1/2004 මහා භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ දෙපාර්තමේන්තු 28 ක් විසින් 2012 වර්ෂය සඳහා

කාර්ය සාධන වාර්තා 2013 සැප්තැම්බර් 16 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.2 විසර්ජන ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්

ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ උපයෝජනය නොකිරීම, වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන නොමැතිව වියදම් දැරීම, හිඟ බැරකම් ගිණුම්වලින් අත්හැරීම්, පුනරාවර්තන වියදම් මූලධන වියදම්වලට අයකිරීම මෙන්ම මූලධන වියදම් පුනරාවර්තන වියදම්වලට අයකිරීම, මූලධන වියදම් පිළිබඳ විස්තර ඉදිරිපත් නොකිරීම, ඉතිරිවීම් සඳහා ප්‍රමාණවත් පැහැදිලි කිරීම් නොවීම හා දෙපාර්තමේන්තු පොත්පත් පළාත් භාණ්ඩාගාරයේ පොත්පත් සමග නොසැසඳීම වැනි නැවත නැවත සිදු වී තිබුණු පොදු අඩුපාඩුකම් පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයකට අදාළව සමාලෝචිත වර්ෂයේදී ද ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම් සම්බන්ධයෙන් නිරීක්ෂණය විය.

### 1.2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් වෙනත් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.80,587,010 ක්වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) පළාත් අමාත්‍යාංශ 03 කින් හා දෙපාර්තමේන්තු 17 කින් විශ්‍රාම ගිය, වැඩ තහනම් කරන ලද සහ සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.7,129,398 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තු 02 ක් විසින් හඳුනා නොගන්නා ලද රු.757,804 ක් වූ ශේෂ සහිතව සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණි.

(ඈ) විවිධ වර්ගයේ කාර්ය මණ්ඩලවලින් අයවියයුතු වර්ෂ 04 කට වැඩි එකතුව රු.42,928,316 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු | ලැබිය යුතු මුදල |
|---|---|
| | රු. |
| ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය | 6,154 |
| පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | 30,052 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 13,693 |
| මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව | 64,448 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 485,747 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 455,855 |
| සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 9,953,945 |
| දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව | 357,736 |
| සමුපකාර සේවක කොමිෂන් සභාව | 1,300 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 2,369,525 |
| අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 29,189,861 |
| එකතුව | 42,928,316 |

### 1.2.4 හිඟ අග්‍රිම ශේෂ නිරවුල් කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අග්‍රිම ශේෂ එකතුව රු.4,924,903 ක් පළාත් දෙපාර්තමේන්තු 02 ක් විසින් 2013 ඔක්තෝබර් 23 දින දක්වා නිරවුල් නොකර පැවතුණි.

(ආ) එවකට වූ උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන් කිරීමට පෙර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාළව 2010 වර්ෂය දක්වා වූ රු.14,285,728 ක අග්‍රිම ශේෂ 2012 දෙසැම්බර් 31 දක්වා නිරවුල් කර නොතිබුණි.

### 1.2.5 වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භෞතික සත්‍යාපන වාර්තා නොමැති වූ බැවින් වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 09 කට වලට අදාළව ගිණුම්වල දැක්වෙන තොග වටිනාකමින් තථ්‍ය තොග වටිනාකම පිළිබිඹු වන්නේද යන්න පිළිබඳ විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

(ආ) පළාත් භාණ්ඩාගාරය විසින් වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 09 ක් සඳහා ඇස්තමේන්තු පිළියෙල කර තිබුණද, වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 03 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් වූ පළාත් මුදල් රීති අංක 286 ප්‍රකාරව ක්‍රියාත්මක නොවන වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු වසා දැමීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) විකුණුම් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාළව රු.2,341,904 ක බැර ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල වෙනම දක්වනු වෙනුවට රු.44,444,787 ක් වූ හර ශේෂයන් සමඟ එකිනෙකට ගලපා පියවා තිබුණි.

### 1.2.6 තැන්පතු ගිණුම් පිළිබඳ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව, සෑම අර්ධ වර්ෂයක්ම අවසානයේ සකස් කළ යුතු කල් ඉකුත් වූ තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ආ) පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගිණුම්වල පැවති වර්ෂ දෙකකට වැඩි කාලයක් ඉක්මවූ රු.49,320,116 ක තැන්පතු ශේෂ පිළිබඳව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට පළාත් දෙපාර්තමේන්තු දෙකක ගිණුම්වල පැවති ශේෂ සහ සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුම් හා මූල්‍ය ප්‍රකාශනවල ශේෂ අතර රු.17,548,828 ක් වූ වෙනස්වීම් තිබුණි. විස්තර පහත දැක්වේ.

| 2012 දෙසැම්බර් 31 දිනට තැන්පතු ශේෂය | විසර්ජන ගිණුම් අනුව ශේෂය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ප්‍රධාන අමාත්‍ය ලේකම් කාර්යාලය | 2,522,258 | 2,522,528 | (270) |
| සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 39,544,078 | 21,994,980 | 17,549,098 |

<u>17,548,828</u>

### 1.2.7 බැංකු සැසඳුම් ප්‍රකාශනවල අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පළාත් පාසැල් හැර, පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාලව ක්‍රියාත්මකව පැවති බැංකු ගිණුම් 102 ක් සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයන් පැවති බව නිරීක්ෂණය විය.

(ii) මාස 06 කට වැඩි කාලයක් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ ආයතන 04 කට අදාලව පැවති රු.372,319 ක් වටිනාකම වූ චෙක්පත් සම්බන්ධයෙන් පළාත් මුදල් රීති අංක 237 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුවේ නම | ඉදිරිපත් නොකළ චෙක්පත් වටිනාකම |
|---|---|
| | රු. |
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 93,330 |
| ප්‍රධාන අමාත්‍ය ලේකම් කාර්යාලය | 4,445 |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | 243,235 |
| ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව | 31,309 |
| එකතුව | 372,319 |

ඉහත සඳහන් ඉදිරිපත් නොකරන ලද චෙක්පත්වල වටිනාකම වූ රු.372,319 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස සලකා තිබුණි.

### 1.2.8 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන පරිදි සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව නිකුත් කරන ලද විගණන විමසුම් 140 කට පිළිතුරු 2013 සැප්තැම්බර් 16 වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි.

| වර්ෂය | නිකුත් කළ විගණන විමසුම් සංඛ්‍යාව | පිළිතුරු නොසැපයූ විගණන විමසුම් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| 2011 | 215 | 20 | 09% |
| 2012 | 256 | 120 | 47% |
| එකතුව | 471 | 140 | |

### 1.2.9 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(i) **විගණකාධිපතිවරයාගේ වාර්තා සමඟ පළාත් සභාවේ වාර්ෂික වාර්තා සභා රැස්වීමේ සභාගත කිරීම**

තේරී පත්වූ පළාත් සභාව 2008 මැයි 10 දින රාජකාරි භාරගෙන තිබුණද, 2011 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සමඟ වාර්ෂික වාර්තාව 2013 සැප්තැම්බර් 16 දක්වා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව සභා රැස්වීමේ සභාගත කර නොතිබුණි.

(ii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුම් සියළුම අමාත්‍යාංශ 05 විසින් හා දෙපාර්තමේන්තු 28 විසින් පිළියෙල කර නොතිබුණි.

(iii) පළාත් මුදල් රීති 432 ප්‍රකාරව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් වාහනවල දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

(iv) දෙපාර්තමේන්තු 14 ක් විසින් පළාත් මුදල් රීති 365 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභා අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු.321,296,432 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.405,024,524 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.726,320,956 ක පිරිහීමක් දැක්වුණි. වේතන, වැටුප් හා වෙනත් වියදම් විශාල ප්‍රමාණයකින් වැඩි වීම එයට හේතු වී තිබුණි.

### 2.2 මූල්‍ය කාර්ය සාධනය

පළාත් භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් අමාත්‍යාංශ 5 ක හා දෙපාර්තමේන්තු 28 ක මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය, පරිපූරක ප්‍රතිපාදන ඇතුළුව මුළු ශුද්ධ ප්‍රතිපාදනය, මුළු තථ්‍ය වියදම සහ ඉතිරිය සාරාංශ කර පහත දැක්වේ.

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | පරිපූරක ප්‍රතිපාදන ඇතුළුව ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | රු.(මිලියන) | රු.(මිලියන) | රු.(මිලියන) | රු.(මිලියන) | % |
| පුනරාවර්තන | 13,521.1 | 13,618.1 | 12,807.1 | 811.0 | 5.96 |
| මූලධන | 1,671.0 | 1,603.0 | 1,135.0 | 468.0 | 29.20 |
| එකතුව | 15,192.1 | 15,221.1 | 13,942.1 | 1,279.0 | 8.40 |

### 2.3 ආදායම හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා සහ ඉකුත් වර්ෂය සඳහා පළාත් සභාවේ සමස්ත ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය | විචලනය | ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය | විචලනය |
| | රු.(මිලියන) | රු.(මිලියන) | රු.(මිලියන) | රු.(මිලියන) | රු.(මිලියන) | රු.(මිලියන) |
| **ආදායම** | | | | | | |
| රජයේ ප්‍රදාන | 11,482 | 10,737 | 745 | 12,410 | 10,952 | 1,458 |
| වෙනත් | 2,236 | 1,805 | 431 | 1,059 | 1,552 | (493) |
| | 13,718 | 12,542 | 1,176 | 13,469 | 12,504 | 965 |
| **වියදම** | | | | | | |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 10,891 | 10,483 | 408 | 10,084 | 9,829 | 255 |
| වෙනත් | 2,727 | 2,324 | 403 | 2,446 | 2,246 | 200 |
| උප එකතුව | 13,618 | 12,807 | 811 | 12,530 | 12,075 | 455 |
| මූලධන වියදම | 1,603 | 1,135 | 468 | 1,588 | 1,253 | 335 |
| මුළු එකතුව | 15,221 | 13,942 | 1,279 | 14,118 | 13,328 | 790 |

### 2.3.1 තථ්‍ය කාර්ය මණ්ඩලය

2012 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත සමස්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පහත ප්‍රකාශයෙන් දැක්වේ.

**පළාත් සභා ආයතනවල කාර්ය මණ්ඩලය (පාසැල් හැර)**

| | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | ඌනතාවය / (අතිරික්තය) |
|---|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණි සහ සහාය ශ්‍රේණි | 26,191 | 24,846 | 1,345 |
| කණිෂ්ඨ ශ්‍රේණි | 4,045 | 4,448 | (403) |

| | | | |
|---|---|---|---|
| එකතුව | 30,236 | 29,294 | 942 |

කණිෂ්ඨ ශ්‍රේණිවල සේවකයින් 403 ක් අතිරික්තව සේවයේ යොදවා තිබුණි.

## 2.4 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

නැගෙනහිර පළාත් සභාවේ පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක සමාලෝචිත වර්ෂය තුළ කාර්ය සාධනය පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 2.4.1 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

--------------------------------------

2012 දෙසැම්බර් 30 දිනැති අංක පීටී/17/2012 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව 2012 දෙසැම්බර් 31 උනට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම 2013 සැප්තැම්බර් 16 වනවිටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.4.2 පළාත් සභා ලේකම් කාර්යාලය

-----------------------------------

(අ) 2008 ජූලි 25 දිනැති අංක 16/2008 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළද පළාත් සභාවේ අමාත්‍යාංශ 05 ක් මගින් පළාත් සභා මන්ත්‍රීවරුන් 23 දෙනෙකුට ඔවුන්ගේ වැටුප්, ඉන්ධන දීමනා හා වෙනත් දීමනාවලට අමතර වශයෙන් රු.8,280,000 ක මුදලක් මාසික ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. පහත දැක්වෙන හේතූන් මත මෙම ගෙවීම අවිධිමත් ගෙවීමක් ලෙස සැලකිය හැකිය.

- ගෙවීම සඳහා බලය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.
- පළාත් සභාවේ එක් එක් මන්ත්‍රීවරයා විසින් පළාත් අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට සිදු කරන ලද සම්බන්ධීකරණ කාර්යයන් හෝ සලසන ලද සේවාවන් තහවුරු කිරීමට සාක්ෂි නොතිබුණි.
- සිදු කරන ලද සම්බන්ධීකරණ කාර්යයන් සඳහා මන්ත්‍රීවරුන්ගෙ පැමිණීම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2001 මාර්තු 28 දිනැති අංක1/2001 දරන පළාත් සභා හා පළාත් පාලන චක්‍රලේඛය ප්‍රකාරව ඇපකරුවන් දෙදෙනෙකු පිළිබඳව සැලකීමෙන් තොරව මන්ත්‍රීවරුන්ට 2010 සිට 2012 වර්ෂය දක්වා රු.7,820,000 ක මුදලක් ණය ලෙස ගෙවා තිබුණි. මේ

සම්බන්ධයෙන් දැනට මන්ත්‍රීවරුන් ලෙස පළාත් සභාවේ නොමැති මන්ත්‍රීවරුන්ගේ රු.969,178 ක්වූ ණය ශේෂ 2013 සැප්තැම්බර් 16 වන විටත් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

**2.4.3 ප්‍රධාන අමාත්‍ය ලේකම් කාර්යාලය**

------------------------------------

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ රැකියා නොමැති තරුණයින් 250 ක් සඳහා කොරියන් භාෂා පන්ති පැවැත්වීම සඳහා පළාත් අරමුදල්වලින් අත්තිකාරමක් ලෙස 2008 වර්ෂය තුළදී රු.2,000,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, කොරියන් භාෂා පන්ති අත්හිටුවා තිබු අතර, අපේක්ෂා කළ පරිදි පාඨමාලා සම්පූර්ණ කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යවරයාගේ හිටපු ලේකම්වරයාට ගෙවා තිබූ අත්තිකාරම අය කර ගැනීමට 2013 සැප්තැම්බර් 16 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 ජූලි 25 දිනැති අංක 16/2008 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට පටහැනිව 2008 සැප්තැම්බර් සිට 2012 ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ ප්‍රධාන ලේකම්ගේ වාහන වලට භාවිතා කළ ඉන්ධන සඳහා ගාස්තු වෙනුවෙන් රු.7,201,500 ක මුදලක් ගෙවා තිබුණි.

**2.4.4 පළාත් භාණ්ඩාගාරය**

------------------------

(අ) **අයවැය පාලනය**

-------------------

ප්‍රතිපාදනය ඉක්මවන ලද වියදම් සම්බන්ධයෙන් වූ බැහැර වීම් කිහිපයක් නිරීක්ෂණය විය. අයවැය ප්‍රතිපාදනය ඉක්මවා දරන ලද වියදම නීත්‍යානුකූල කිරීම සඳහා විවිධ පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂයෙන් අරමුදල් මාරු කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තු කිහිපයක් පිළියෙල කර තිබුණු හෙයින් අයවැය ලේඛනය තාත්වික පදනමකින් පිළියෙල කර නොතිබුණු බවත් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බවත් දක්නට ලැබුණි. විස්තර පහත දැක්වේ.

- පරිපූරක ඇස්තමේන්තු 34 ක් මගින් විවිධ පළාත් අමාත්‍යාංශ සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා සමාජ සේවා

දෙපාර්තමේන්තුව ආදී දෙපාර්තමේන්තුවලට පළාත් භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂවලින් රු.74,536,455 ක් වූ අරමුදල් මාරු කර තිබුණි.

- අරමුදල් මාරු කිරීම පළාත් මුදල් රෙගුලාසි 45 ඉල්ලුම්පත්‍ර 59 ක් මගින් සිදුකර තිබුණි. කෙසේ වුවද අරමුදල් මාරුකිරීම් සඳහා ඉල්ලුම්පත්‍ර පළාත් මුදල් රෙගුලාසි 45 වෙනුවට මුදල් රෙගුලාසි 66 ලෙස දක්වා තිබුණි.
- පළාත් අමාත්‍යාංශ 5 ක සහ දෙපාර්තමේන්තු 28 ක රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සීමා හා වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු සීමා ප්‍රධාන ලේකම් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්- මුදල් විසින් අවස්ථා 06 කදී සංශෝධනය කර තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට රු.534,105,799 ක්වූ පළාත් රාජ්‍ය සේවා නිලධාරීන් විසින් කරන ලද වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපට දායකයන් (W&OP) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර පළාත් භාණ්ඩාගාරයේ තැන්පතු ගිණුම්වල තබා තිබුණි.

**(ඇ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

------------------------------

(i) 2012 දෙසැම්බර් 09 දිනැති අංක 222/2012 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ආදායම් ගිණුම් 2013 සැප්තැම්බර් 16 වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) පළාත් මුදල් රීති 144(2) ප්‍රකාරව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් ගිණුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම පළාත් මුදල් රීති 142 ප්‍රකාරව හිඟ ආදායම පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා ද පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2012 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ බැංකු ඉතිරි කිරීම් ගිණුමේ රු.566,363,123 ක් වූ මුදලක් පළාත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමෙන් තොරව පැවතුණි. මේ සම්බන්ධයෙන් ඉතිරි කිරීමේ ගිණුමෙන් ජනනය වූ රු.20,950,712 ක පොලිය ගිණුම්වලට ගෙන නොතිබුණි.

**2.4.5 සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

--------------------------------------------------

පහත දැක්වෙන වත්කම් විෂයයන් ඉතා දීර්ඝ කාලයක් අරමුණු කළ කාර්යයන්ට යොදා ගෙන නොතිබුණි.

| සත්ව ශල්‍යවෛද්‍ය කාර්යාලයේ නම | AI කැන් | ලීටර් 10 කිරි කැන් (Milkcan) | ප්‍රමාණය<br>යතුරු ලියන |
|---|---|---|---|
| ------------------------- | ------------- | -------------- | -------- |
| අක්කරෙයිපත්තු | 07 | 03 | 01 |
| අලයඩිවෙම්බු | - | 02 | - |
| ඉරක්කාමම් | 03 | - | - |
| | ----- | ------ | ------ |
| | 10 | 05 | 01 |

2.4.6 ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව
-------------------------------------------------

(අ) පහත දැක්වෙන විවීමේ මධ්‍යස්ථානවල හැන්ඩ්ලූම් මධ්‍යස්ථාන ගොඩනැගිලි 06 ක්, විවීමේ යන්ත්‍ර 98 ක් සහ එතීමේ (Winding ) යන්ත්‍ර 13 ක් නිෂ්කාර්යව තිබෙන්නට ඉඩහැර තිබුණි.

| විවීමේ මධ්‍යස්ථානය | විවීමේ යන්ත්‍ර | ගොඩනැගිල්ල | එතීමේ (Winding ) යන්ත්‍ර |
|---|---|---|---|
| --------------------- | -------------- | ----------------- | ------------------ |
| පෙරියතුමුනයි | 06 | - | - |
| පඩ්ඩිතිඩාල් | 02 | - | - |
| අම්පාර | 04 | - | - |
| මල්වත්ත | 01 | - | - |
| දමන | 05 | - | - |
| අලයඩිවෙම්බු | 36 | - | - |
| නින්දවුර් | 08 | - | - |

| | | | |
|---|---|---|---|
| කරෙයිතිව් | 04 | - | - |
| සමන්තුරෙයි | 06 | - | - |
| වීරමුනෙයි | 04 | - | - |
| ඕලුවිල් | 01 | - | - |
| කුරන්ගකර්නි | 03 | 01 | 07 |
| සේරුනුවර | 11 | 01 | 03 |
| කන්තලේ | 07 | 01 | 03 |
| වෙල්ලයිමනාල් | - | 01 | - |
| සාම්පල්තිවු | - | 01 | - |
| පූවරසන්තිවු | - | 01 | - |
| | ----- | ------- | -------- |
| | 98 | 06 | 13 |

(ආ) අලයඩිවෙම්බු විවීමේ මධ්‍යස්ථානයේ අවිධිමත් කළමනාකරණය හේතුවෙන් රු.මිලියන 1 කට වඩා වටිනාකම වු විවීමේ ද්‍රව්‍යවල වලංගු කාලය ඉක්මවා තිබුණි.

(ඇ) විනයාගපුරම් කොහු කෙදි (Coir) මධ්‍යස්ථානයේ කොහු නිෂ්පාදන විදුලි යන්ත්‍ර 5 ක් මාස 6 කට වැඩි කාලයක් නිෂ්කාර්යව තිබෙන්නට ඉඩහැර තිබුණි.

**2.4.7 අධ්‍යාපන, සංස්කෘතික කටයුතු, ඉඩම් සංවර්ධන හා ප්‍රවාහන අමාත්‍යාංශය**

දැයට කිරුළ ප්‍රදර්ශනය 2012 පෙබරවාරි 04 දින සිට පෙබරවාරි 11 දක්වා පැවැත්වුණි. ප්‍රදර්ශනය නිමවීමෙන් පසු 2012 පෙබරවාරි 18 දින දැයට කිරුළ සඳහා විදුලි අලෝකය හා ශබ්ද පරිපාලනය ( Sound System ) සඳහා මිල ගණන් ලබාගෙන තිබුණි. තවද ටෙන්ඩර් මණ්ඩල රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි.

**2.4.8 නැගෙනහිර පළාත් මාර්ග මගී ප්‍රවාහන අධිකාරිය**

**(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

නැගෙනහිර පළාත් මාර්ග මගී ප්‍රවාහන අධිකාරියේ 2009 අංක 02 දරන ව්‍යවස්ථාවලි පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව නැගෙනහිර පළාත් මාර්ග මගී ප්‍රවාහන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී මාස 06 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද, 2011 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2013

සැප්තැම්බර් 09 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2012 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2013 සැප්තැම්බර් 16 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) **බලපත්‍ර මාරු කිරීම් ගාස්තු අඩුවෙන් අයකිරීම**

අංක 1757/02 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව මාර්ග සේවා බලපත්‍රය නිත්‍යානුකූල අනුප්‍රාප්තිකයාට හැර වෙනත් අයෙකුට මාරු කිරීමේදී ගෙවිය යුතු ගාස්තුව රු.100,000 ක් විය යුතුය. කෙසේ වුවද ඉහත ගැසට් නිවේදනයට පටහැනිව අම්පාර දිස්ත්‍රික්කයේ එවැනි පුද්ගලයන්ගෙන් රු.50,000 ක් පමණක් අයකර තිබීම හේතුවෙන් රු.250,000 ක මුදලක් අඩුවෙන් අයකර තිබුණි.

(ඇ) **කළමනාකරණයේ දුර්වල වගකීම**

අම්පාර දිස්ත්‍රික් කාර්යාලය විසින් පවත්වා තිබුණු වාර්තා ප්‍රකාරව පහත සඳහන් වාහන ලිපිගොනු නම් මාරු කිරීම හා වෙනත් කරුණු සඳහා ප්‍රධාන කාර්යාලයට යවා තිබුණි. කෙසේ වුවද පහත විස්තර දැක්වෙන පරිදි දර්ඝ කාලයක් කටයුතු කිරීමෙන් තොරව එම ලිපිගොනු ප්‍රධාන කාර්යාලයේ තබා තිබුණි.

| | 2013 ජුලි 15 දක්වා | 2012 වර්ෂය | 2011 වර්ෂය |
|---|---|---|---|
| නම මාරුකිරීම සඳහා වූ ලිපිගොනු සංඛ්‍යාව | 03 | 12 | 02 |
| වෙනත් කරුණු සඳහා වූ ලිපිගොනු සංඛ්‍යාව | 07 | 03 | 02 |

(ඈ) නැගෙනහිර පළාතේ මාර්ග මගී ප්‍රවාහන අධිකාරියේ 2010 නොවැම්බර් 25 දිනැති අංක 2010.05 දරන ප්‍රාදේශීය චක්‍රලේඛයේ 3 ජේදය ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල් හෝ

අධ්‍යක්ෂගේ (මෙහෙයුම් හා සැලසුම් ) අනුමැතිය ලබාගැනීමෙන් තොරව අම්පාර දිස්ත්‍රික් කාර්යාලය විසින් බලපත්‍ර මාරු කිරීම සඳහා ගාස්තු අයකර තිබුණි.

2.4.9 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ දෙපාර්තමේන්තුව

----------------------------------------------

(අ) කලාප අධ්‍යාපන කාර්යාලය - ත්‍රිකුණාමලය

----------------------------------------------

(i) විශාල ප්‍රමාණයේ පස් වැඩ සඳහා පැය 40 කට බල්ඩෝසර් ඩී 8 යොදා ගැනීමට ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. නමුත් පැය 80 ක් වැය කර තිබුණද, ඩී 4 බුල්ඩෝසරය පමණක් භාවිතා කර තිබුණි. කෙසේ වුවද එම වෙනස් කිරීම සඳහා අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) අත්තිකාරම් වැඩ සඳහා පැය 8 කට බැක්හෝ - අශ්ව බල 200 යොදා ගැනීම සඳහා ඇස්තමේන්තු පිළියෙල කර තිබුණද, පැය 13 ක් සඳහා ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද වැඩිපුර පැය සඳහා අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ගිවිසුම අනුව නිමකළ යුතු දිනය 2011 සැප්තැම්බර් 15 දින වුවද, තථ්‍ය නිම කිරීම් දිනය 2011 නොවැම්බර් 03 දින විය. 2011 සැප්තැම්බර් 15 සිට ප්‍රමාණ කළ අලාභ රු.22,572 ක් අයකර නොතිබුණි.

(iv) **උප - කොන්ත්‍රාත්කරුවන්ට වැඩ භාරදීම**

----------------------------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.9.1 වගන්තියට සහ 2011 සැප්තැම්බර් 27 දිනැති අංක 452 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනිව එකතුව රු.7,009,505 ක් වූ ඉදිකිරීම් වැඩ පාසැල් සංවර්ධන සමිතිය (SDS) විසින් උප කොන්ත්‍රාත්කරුවන්ට ලබාදී තිබුණි.

(v) **පාසල් සංවර්ධන සමිති සඳහා වූ සෘජු කොන්ත්‍රාත්තු**

----------------------------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.9.1 වගන්තිය අනුව, කාර්යයන් බලය ලත් ප්‍රදේශය හා සමිතියේ විෂය පථය ඇතුළත විය යුතුය. කෙසේ වුවද

එකතුව රු.5,045,608 ක් වූ කාර්යයන් 11 ක් ඉහත උපදෙස් වලට පටහැනිව සිදුකර තිබුණි.

**(ආ) කලාප අධ්‍යාපන කාර්යාලය - මුතූර්**

(i) පළාත් මුදල් රීත 219(2) ට පටහැනිව රු.207,300 ක මුදලක් නිරවුල් නොකළ අත්තිකාරම් ලෙස දීර්ඝ කාලයක් පැවතුණි.

(ii) පළාත් මුදල් රීති 570 හා 571 ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව රු.1,896,271 ක මුදලක් 2000 වර්ෂය සිට 2010 දක්වා තැන්පතු ගිණුමේ පැවතුණි.

(iii) නිලධාරීන් විසින් පෙර ලබාගත් අත්තිකාරම් නිරවුල් කර නොතිබුණද, උප අග්‍රිමය අත්තිකාරම් ලබාදී තිබුණි. තවද පළාත් මුදල් රීති 371 ට පටහැනිව රු.50,000 ට වැඩි උප අග්‍රිම අත්තිකාරම් ලබාදී තිබුණි.

**(ඇ) කලාප අධ්‍යාපන කාර්යාලය - කන්තලේ**

(i) 2012 ජුනි මාසය සඳහා හඳුනානොගත් ගෙවීම් ලෙස රු.248,421.20 ක මුදලක් බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. ගෙවීම් දිනය 2006 ඔක්තෝබර් 31 දින වූ අතර මෙම අඩුපාඩු සඳහා හේතු විමර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව රු.1,606,034.82 ක මුදලක් 2002 වර්ෂයේ සිට තැන්පතු ගිණුමේ පැවතුණි.

**2.4.10 සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

**(අ) පාපැදි මිලදී ගැනීම - රු.390,600**

2012 වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහන අනුව, නගර සහ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් (DS) කොට්ඨාශයේ පුහුණුව සඳහා තෝරාගත් තරුණයින්ට මෙවලම් කට්ටල ලබාදීම සඳහා උපමාන පාදක ප්‍රදාන (CBG) යටතේ රු.400,000 ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ වුවද පහත පරිදි පාපැදි නිකුත් කර තිබුණි.

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** **පාපැදි සංඛ්‍යාව**

| | |
|---|---|
| එරාවූර් | 26 |
| මුතූර් | 05 |
| නගර සහ කඩවත් සතර - අලන්කුලම් | 05 |

(ආ) 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන අයවැය චක්‍රලේඛය අනුව ඉන්ධන සඳහා වියදම් 2012 ඇස්තමේන්තු ප්‍රතිපාදන තුළ හා 2012 ජනවාරි මස ඉන්ධන සඳහා දරන ලද වියදම පදනම් කර ගෙන විය යුතු බවට තහවුරු කර ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම් වගකිව යුතුය. කෙසේ වුවද, වැය අංක 950-03-02-1202 ඉන්ධන හා ලිහිසි තෙල් වියදම එක් එක් මාසයේ වැඩිවී තිබුණු අතර ඉහත චක්‍රලේඛයට පටහැනිව අතිරේකව රු.510,000 ක් (ඇස්තමේන්තුවෙන් සියයට 85 ක් ) වීරමොන් ක්‍රියාපර්පාටිය මඟින් මාරුකර තිබුණි.

## 2.4.11 සෞඛ්‍ය සේවා පළාත් අධ්‍යක්ෂ

(අ) 2012 දෙසැම්බර් 31 දිනට තැන්පතු ශේෂය ලෙස රු.39,544,078 ක මුදලක් විසර්ජන ගිණුමේ දක්වා තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.21,994,980 ක මුදලක් පමණක් දක්වා තිබුණි.

(ආ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ නෙට් කොම් ටෙක්නොලොජි ආයතනයේ අධ්‍යක්ෂ අතර 2010 ජූනි 01 සිට 2011 දෙසැම්බර් 31 දක්වා පරිගණක නඩත්තු කිරීම වෙනුවෙන් 2010 ජූනි 01 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර මාසිකව රු.200,000 ක ගෙවීම් සදුකර තිබුණි. කෙසේ වුවද ගිවිසුම ප්‍රකාරව සියළුම පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර තාක්ෂණික නිලධාරියකු විසින් පරීක්ෂා කර නොතිබුණි.

**(ඇ) මානව සම්පත් කළමනාකරණය**

කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබාගැනීමෙන් තොරව වෛද්‍ය නිලධාරීන්, වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදීන්, II ශ්‍රේණියේ හෙදියන් , උපස්ථායකයින්, රසායනාගාර ඔඩර්ලිවරුන් , මුරකරුවන් , රියදුරන් , කා.කා.ස වරුන් ආදී වශයෙන් නිලධාරීන් 192 ක් පහත විස්තර දැක්වෙන පරිදි යොදවා තිබුණි.

| අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය | අතිරික්තය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| මහ රෝහල - ත්‍රිකුණාමලය | 199 | 291 | 92 |
| මූලික රෝහල - කන්තලේ | 63 | 73 | 10 |
| මූලික රෝහල - මුතූර් | 31 | 65 | 34 |
| ග්‍රාමීය රෝහල - තඹලගමුව | 30 | 14 | 16 |
| මූලික රෝහල - කින්නියා | 29 | 69 | 40 |
| | 352 | 512 | 192 |

(ඇ) **ආහාර සැපයීම**

ත්‍රිකුණාමලය මහ රෝහල, මුතූර් මූලික රෝහල, තඹලගමුව ග්‍රාමීය රෝහල, පුල්මොඩෙයි ග්‍රාමීය රෝහල, කි

(ඉ) **මහ රෝහල - ත්‍රිකුණාමලය**

පළාතේ මුදල් රීති 365 ප්‍රකාරව 2010 , 2011 හා 2012 වර්ෂ සඳහා භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි.

(ඊ) **මූලික රෝහල - කන්තලේ**

(i) මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව රු.123,798 ක මුදලක් තැන්පතු ගිණුමේ තබා තිබුණි.

(ii) විදුලි උත්පාදන යන්ත්‍රයක් උපයෝජනය කිරීමෙන් තොරව වර්ෂ 2 කට වැඩි කාලයක් නිෂ්කාර්ය ලෙස ගබඩාවේ තබා තිබුණි.

(iii) කන්තලේ මූලික රෝහලේ ගබඩාවේ තබා තිබූ කල් ඉකුත් වූ ඖෂධ විෂයයන් 40 ක් විනාශ කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - තඹලගමුව**

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ඖෂධ ගබඩාවේ 2012 නොවැම්බර් 22 දින සිදුකරන ලද භෞතික සත්‍යාපනයේ පහත විස්තර දැක්වෙන පරිදි වටිනා ඖෂධ ඌනතාවයන් හා අතිරික්තයන් ලෙස දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද එම ඖෂධ පිළිබඳ විමර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි.

| විෂයයන් | පොත් ශේෂය | තථ්‍ය ශේෂය | ඌනතාවය | අතිරික්තය |
|---|---|---|---|---|
| | ප්‍රමාණය | ප්‍රමාණය | පමාණය | ප්‍රමාණය |

| | | | | |
|---|---|---|---|---|
| ෆෝලික් ඇසිඩ් ( Folic Acid ) | 1,000 | 10,000 | - | 9,000 |
| ෆෙරනර් සින්ල්පේට් Ferronr Sinlphate (Prowse Caliphate ) | 6,000 | 5,000 | 1,000 | - |
| විටමින් බී | 4,000 | 2,000 | 2,000 | - |
| කැල්සියම් ලැක්ට් (Calcium Lackte) | 12,000 | 11,000 | 1,000 | - |

**(ඌ) සෞඛ්‍ය සේවා ප්‍රාදේශීය අධ්‍යක්ෂ**

-----------------------------------

පළාත් මුදල් රීති 365 ප්‍රකාරව සාමාන්‍ය ද්‍රව්‍ය ගබඩා සඳහා 2010 වර්ෂයේ සිටද ශල්‍ය ද්‍රව්‍ය ගබඩා සඳහා 2009 සිටද භාණ්ඩ සමීක්ෂණ සිදුකර තිබුණි.

2.4.12 **දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව**

----------------------------------

ආහාර සැපයීම බලය ලත් නිලධාරියකු විසින් විධිමත්ව පරික්ෂා කර නොතිබුණු අතර වාට්ටුවල ආහාර ලේඛන විධිමත්ව පවත්වා නොතිබුණි. තවද වෛද්‍යවරුන් විසින් නිර්දේශ කරන ලද පරිදි ආහාර සැපයීමේ උපලේඛනය (Schedule ) ආහාර සැපයුම්කරු විසින් අනුගමනය කර නොතිබුණි.

2.4.13 **ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

-------------------------------

**අත්තිකාරම් ගෙවීම**

--------------------

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ත්‍රිකුණාමලය විසින් වියදම් ඇස්තමේන්තු නොමැතිව අත්තිකාරම් ගෙවීම් සිදුකර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **කාර්යය** | **ගෙවන ලද මුදල** |
|---|---|
| --------- | --------------- |
| | රු. |

| | |
|---|---|
| ක්‍රීඩා උත්සවය - නැගෙනහිර පළාත | 20,000 |
| කළමනාකරණ ගාස්තු සඳහා අග්‍රිම | 300,000 |
| පුනරාවර්තන වැඩ සඳහා අග්‍රිම මුදා හැරීම | 175,000 |
| පුනරාවර්තන වැඩ සඳහා අග්‍රිම මුදාහැරීම | 100,000 |

## 2.5 අරමුදල් උපයෝජනය

පළාත් සභා කාර්යාලවල සංවර්ධන වැඩ යෝජනා සඳහා විවිධ ප්‍රභවයන්ගෙන් ලැබී තිබුණු ප්‍රතිපාදන හා එයින් දරන ලද තථ්‍ය වියදම පිළිබඳ විස්තර පහත දැක්වේ. කෙසේ වුවද, ඉතිරි මුදල් අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට අර්ථවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

| | විෂය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය | උපයෝජනය ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | % |
| (i) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 857,000,000 | 610,000,000 | 247,000,000 | 28.82 |
| (ii) | සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය (HSDP) | 5,000,000 | - | 5,000,000 | 100 |
| (iii) | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) | 167,000,000 | 159,593,539 | 7,406,461 | 4.44 |
| (iv) | උපමාන පාදක ප්‍රදාන (CBG) | 267,000,000 | 145,780,000 | 121,220,000 | 45.40 |
| (v) | දිළිඳු හිතකාමී ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය / එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) | 23,000,000 | 5,227,248 | 17,772,752 | 77.27 |
| (vi) | පාසැල් 1000 ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන (ශ්‍රීලංර හා ලෝක බැංකුව) | 144,000,000 | 125,000,000 | 19,000,000 | 13.19 |
| (vii) | ශ්‍රී ලංකා රජය | 40,000,000 | 32,760,000 | 7,240,000 | 18.10 |

## 2.6 හඳුනා ගන්නා ලද පාඩු

අමාත්‍යාංශයක හා දෙපාර්තමේන්තුවක විසර්ජන ගිණුම්වල 2012 දෙසැම්බර් 31 දිනට හඳුනා ගන්නා ලද පාඩු හා ලියා හැරිය යුතු පාඩු ලෙස රු.1,354,424 ක මුදලක් වාර්තා කර තිබුණි. කෙසේ වුවද, පළාත් මුදල් රීති 69 ප්‍රකාරව මෙම පාඩු ලියා හැරීමට අදාළ දෙපාර්තමේන්තු විසින් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

## 2.7 පළාත් පාලන ආයතනවල කටයුතු අධීක්ෂණය

-----------------------------------------------

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයේ 8 උප ලේඛනයේ 4.2 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, පළාතේ පළාත් පාලන ආයතන පිළිබඳ අධීක්ෂණය පළාත් සභාව වෙත පවරා තිබුණි. පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු, අදාළ පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ අවධානයට යොමු කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන 45 කින් පළාත් පාලන ආයතන 03 ක් සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ගිණුම් 2013 සැප්තැම්බර් 16 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණනය සඳහා ඵලදායී හා අර්ථවත් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන කොමසාරිස්වරයා හෝ ප්‍රධාන ලේකම්වරයා හෝ නැගෙනහිර පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශයේ විෂයභාර ලේකම්වරයා හෝ පියවර ගෙන නොතිබුණි.

**(ඇ) වෙළඳපොළ ගොඩනැගිල්ල ඉදි කිරීම - රු. මිලියන 5.84**

-------------------------------------------------------------

ත්‍රිකුණාමලය නගර සභාව විසින් රු.5,830,887 ක පිරිවැයකට ඉදි කරන ලද වෙළඳපොළ සඳහා ගොඩනැගිල්ල වර්ෂ 08 කට වැඩි කාලයක් උපයෝජනය කර නොතිබුණු අතර, වෙනත් ආයතන විසින් එය භාවිතා කරමින් පැවතුණි.

**(ඇ) හිඟ ආදායම - රු.249,826,198**

-------------------------------------

පහත විස්තර දැක්වෙන පරිදි 2012 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන 45 ක වරිපණම්, බදුකුලී සහ වෙනත් ආදායම් හිඟව පැවති බව වාර්තා විය.

| පළාත් පාලන ආයතනය | පළාත් පාලන ආයතන සංඛ්‍යාව | මුදල |
|---|---|---|

| ----------------- | ----------------------------------- | ------ |
|---|---|---|
| | | රු. |
| මහ නගර සභා | 03 | 69,906,885 |
| නගර සභා | 05 | 104,438,116 |
| ප්‍රාදේශීය සභා | 37 | 119,166,970 |
| | ---- | ---------------- |
| එකතුව | 45 | 293,511,971 |

මේ සම්බන්ධයෙන් අදාල පළාත් පාලන ආයතන විසින් රු.293,511,971 ක්වූ හිඟ ආදායම රැස්කර ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-------------------------------

ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුව පළාත් පාලන ආයතන ප්‍රදේශ තුළ පිහිටා ඇති උසාවිවලින් පනවන ලද දඩ සහ දේපල පැවරීමේදී අයකරන ලද මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන විසින් නියමිත වේලාවට ඉල්ලීම් නොකිරීම හේතුවෙන් පළාත් පාලන ආයතනවලට ප්‍රේෂණය කිරීමෙන් තොරව පළාත් සභාව විසින් හෝ වෙනත් බලධාරීන් විසින් තම භාරයේ තබා ගෙන තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට එසේ අයකර නොගන්නා ලද උසාවි දඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| **පළාත් පාලන ආයතනය** | **මුදල** |
|---|---|
| ---------------------------- | ------ |
| | රු. |
| මහ නගර සභා | 28,963,646 |
| නගර සභා | 27,374,545 |
| ප්‍රාදේශීය සභා | 77,813,009 |
| | ----------------- |
| එකතුව | 134,151,200 |

(ඊ) පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ගිණුම් විගණනයේදී නිරීක්ෂණය වූ පොදු අඩුපාඩු සාරාංශ කර පහත දැක්වේ.

(i) පළාත් පාලන පළාත් කොමසාරිස්ගේ විමර්ශන නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වාර්තා පිළිබඳව පළාත් පාලන පළාත් කොමසාරිස් විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම පිළිබඳව අධික ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(iii) උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ පාලන ගිණුම් ශෙෂයන් සසඳා නොතිබුණි.

(iv) පළාත් පාලන ආයතන කිහිපයක මන්ත්‍රීවරුන් නිල වාහන භාවිතා කිරීමේ හිමිකම නොමැති වුවද, නිල වාහන භාවිතා කර තිබුණි.

(v) ස්වකීය ශ්‍රම බලකාය යොදා ගනිමින් පළාත් පාලන ආයතන විසින් ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද විධිමත් කාර්ය පත්‍රිකා පිළියෙල කර නොතිබුණි. එබැවින් ඉන්වෙන්ටරි පාලනයක් හෝ තොග පාලනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන්, විගණනයේදී තොග තත්ත්වය පරීක්ෂා කිරීමට හා තොග ඌනතා/අතිරික්ත නිශ්චය කර ගැනීමට නොහැකි විය.

## 2.8 අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් මුදල් රීති 101 ප්‍රකාරව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන වැඩ සටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිවරයාගේ උපදෙස් ලබාගෙන නොතිබුණි.

(ආ) පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන ලද බොහෝ කරුණු පිළිබඳව පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අර්ථවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පිරිස් කළමනාකරණය, අයවැය, වියදම්, ගෙවීම්, පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම්, වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු, වත්කම් කළමනාකරණය, ගිණුම් වාර්තා පැවැත්වීම, බැංකු ගිණුම් සහ අග්‍රිම පිළිබඳ පාලනය, වාහන උපයෝජනය සහ අභ්‍යන්තර විගණන කටයුතු ආදී ක්ෂේත්‍රයන්හි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර නිකුත් කරන ලද විගණන විමසුම් මගින් අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ හා ප්‍රධාන ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලදී.